අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/09/12/06/05/01 - 2025

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2025.12. 09

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන් නැවත ආරම්භ කිරීම**

රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් (ඇමුණුමෙහි සඳහන් පාසල් හැර) සහ පිරිවෙන් සඳහා 2025 වර්ෂයෙහි තෙවන පාසල් වාරයේ දෙවන අදියර 2025.12.16 වන දින ආරම්භ කිරීමට නියමිත ය.

ඒ අනුව, අධ්‍යයන ක්‍රියාවලිය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බව කාරුණික ව දන්වමි.

**1.0 අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා පාසල සූදානම් කිරීම**

1.1 ඇමුණුමෙහි සඳහන් පාසල් හැර අනෙකුත් සියලු ම පාසල්වල පිරිසිදු කිරීම් කටයුතු අදාළ පාර්ශව සම්බන්ධීකරණය කර ගනිමින් 2025.12.15 වන දිනට පෙර නිසි පරිදි සිදු කර ඇති බවට තහවුරු කර ගත යුතු ය.

මෙහි දී සැලකිලිමත් විය යුතු කරුණු
- අවදානම් සහිත ගස් හෝ අතු /ගොඩනැගිලි / තාප්ප / වහල ආදිය පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.
- සනීපාරක්ෂක හා ජල පහසුකම්
- විෂබීජහරණය හා ඩෙංගු මර්දන කටයුතු

1.2 2025.12.15 දින අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලු ම නිලධාරීන් රාජකාරි සඳහා වාර්තා කළ යුතු අතර, 2025.12.16 වන දිනට පාසල ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයේ පවතින බවට තහවුරු කර ගත යුතු ය.

1.3 ඇමුණුමෙහි සඳහන් 2025.12.16 දිනට ආරම්භ නොකරන පාසල්වල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල නිලධාරීන් 2025.12.15 දින තම පදිංචි ස්ථානයට ආසන්නතම කොට්ඨාස / කලාප අධ්‍යාපන කාර්යාල වෙත වාර්තා කළ යුතු අතර එදිනට ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දිය යුතු ය. අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් එම නිලධාරීන් සේවා අවශ්‍යතාවය අනුව සුදුසු පාසල් වෙත තාවකාලිකව අනුයුක්ත කළ යුතු ය.

**2.0 2025 වර්ෂයේ අධ්‍යයන කටයුතු සඳහා පාසල් ආරම්භ කිරීම හා අවසන් කිරීම**

2.1 පාසල් වාර සටහන - 2025 සම්බන්ධව නිකුත් කරන ලද අංක ED/09/12/06/05/01 -2025 හා 2025.04.23 දිනැති ලිපියෙහි සඳහන් 2025 වර්ෂයේ තෙවන පාසල් වාරයේ දෙවන අදියර පහත පරිදි සංශෝධනය විය යුතු ය.



CamScanner

**සිංහල හා දෙමළ පාසල් සඳහා:**

| වාරය | වාරය පැවැත්වෙන කාල වකවානු |
|---|---|
| තෙවන වාරය | <u>දෙවන අදියර</u><br>2025.12.16 අඟහරුවාදා සිට 2025.12.22 සඳුදා තෙක්<br>**(2025.12.23 දින සිට 2025.12.28 දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| | <u>තෙවන අදියර</u><br>2025.12.29 සඳුදා සිට 2025.12.31 බදාදා තෙක් |

**මුස්ලිම් පාසල් සඳහා:**

| වාරය | වාරය පැවැත්වෙන කාල වකවානු |
|---|---|
| තෙවන වාරය | <u>දෙවන අදියර</u><br>2025.12.16 අඟහරුවාදා සිට 2026.01.02 සිකුරාදා තෙක්<br>(2025.12.27 සෙනසුරාදා දින ද ඇතුළත්ව) |

**2.2 තෙවන වාරයේ අධ්‍යයන කටයුතු සිදු කිරීම**

2.2.1. විෂය නිර්දේශය ආවරණය කර නොමැති පාසල්වල විෂය නිර්දේශ ආවරණය කිරීමට කටයුතු කළ යුතු ය.

2.2.2. විෂය නිර්දේශය ආවරණය කර ඇත්නම්, එම පාසල්වල පුනරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

2.2.3. එමෙන් ම, ජාතික ව්‍යසනයක දී කටයුතු කළ යුතු ආකාරය, ආපදා කළමනාකරණය හා සහන සේවා කටයුතු පිළිබඳව සිසුන් දැනුවත් කිරීම ද, සිසුන්ගේ සමාජ චිත්තවේග කුසලතා වර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදු කළ හැකි ය.

**2.3 වාර විභාග පැවැත්වීම**

2.3.1.නැවත පාසල් පරිසරයට දරුවන් අනුගත කර ඔවුන්ගේ මානසික සෞඛ්‍ය යහපත් කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකම්වලට මූලිකත්වය ලබා දී කටයුතු කළ යුතු බැවින්, වාර විභාග පැවැත්වීමකින් තොරව සිසුන් ඊළඟ ශ්‍රේණියට උසස් කළ යුතු ය.

2.3.2. 11 ශ්‍රේණියේ සිසුන්ට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමට පෙරහුරුවක් වන බැවින් එම සිසුන් සඳහා සුදුසු පරිදි 2026 ජනවාරි මස දී විභාග පෙරහුරුවක් පැවැත්වීම සුදුසු ය.

2.3.3. 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා සිසුන්ට 2025 වර්ෂය සඳහා තෙවන වාර විභාගය නොපැවැත්විය යුතු අතර, ඔවුන්ට සාධන මට්ටම ඇගයීම සඳහා පන්ති මට්ටමින් ඇගයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි ය.

CamScanner

## 3.0 2026 වර්ෂයේ අධ්‍යයන කටයුතු සඳහා පාසල් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම

3.1 පාසල් වාර සටහන - 2026 සම්බන්ධව 2025.09.11 දිනැති අංක 30/2025 චක්‍රලේඛයේ සඳහන් 2026 වර්ෂයේ පළමු පාසල් වාරය පහත පරිදි සංශෝධනය වන අතර 2026 වර්ෂයේ දෙවන හා තෙවන වාරයන් උක්ත චක්‍රලේඛය පරිදිම ක්‍රියාත්මක වේ. තව ද, විභාග දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත පාසල් විභාග පැවැත්වෙන දිනයන්හි වෙනසක් සිදු නොවේ.

සිංහල හා දෙමළ පාසල් සඳහා:

| වාරය | වාරය පැවැත්වෙන කාල වකවානු |
|---|---|
| පළමු වාරය | <u>පළමු අදියර</u><br>2026.01.05 සඳුදා සිට 2026.01.09 සිකුරාදා තෙක්<br>**(2025 - අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ඉතිරි විෂයන් සඳහා විභාගය පැවැත්වීමට 2026.01.10 දින සිට 2026.01.20 දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| | <u>දෙවන අදියර</u><br>2026.01.21 බදාදා දින සිට 2026.02.13 සිකුරාදා තෙක්<br>**(2025 (2026) – අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා 2026.02.14 දින සිට 2026.03.02 දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| | <u>තෙවන අදියර</u><br>2026.03.03 අඟහරුවාදා දින සිට 2026.04.10 සිකුරාදා<br>**(2026.04.11 දින සිට 2026.04.19 දින තෙක් දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |

මුස්ලිම් පාසල් සඳහා:

| වාරය | වාරය පැවැත්වෙන කාල වකවානු |
|---|---|
| පළමු වාරය | <u>පළමු අදියර</u><br>2026.01.05 සඳුදා සිට 2026.01.09 සිකුරාදා තෙක්<br>**(2025 - අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ඉතිරි විෂයන් සඳහා විභාගය පැවැත්වීමට 2026.01.10 දින සිට 2026.01.20 දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| | <u>දෙවන අදියර</u><br>2026.01.21 බදාදා දින සිට 2026.02.13 සිකුරාදා තෙක්<br>**(2025 (2026) – අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා සහ රාමසාන් උත්සවය සඳහා 2026.02.14 දින සිට 2026.03.22 දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| | <u>තෙවන අදියර</u><br>2026.03.23 සඳුදා සිට 2026.04.10 සිකුරාදා තෙක්<br>**(2026.04.11 දින සිට 2026.04.19 වන දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |
| | <u>සිව්වන අදියර</u><br>2026.04.20 සඳුදා සිට 2026.04.30 බ්‍රහස්පතින්දා තෙක්<br>**(2026.05.01 දින සිට 2026.05.03 වන දින තෙක් නිවාඩු ලබා දෙනු ලැබේ)** |

3.2 2026 වර්ෂයේ පළමු ශ්‍රේණිය 2026.01.22 බ්‍රහස්පතින්දා දින ආරම්භ කළ යුතු ය.

3.3 මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2025.11.04 දිනැති චක්‍රලේඛ අංක 34/2025 හි උපදෙස් අනුව 2026 වර්ෂයට අදාළ කාල සටහන සකස් කර, ඒ අනුව 2026 ජනවාරි 05 වන දින සිට කටයුතු කළ යුතු ය.

3.4 2026 වර්ෂයේ පළමුවන වාරයේ පළමු අදියරේ දී එනම්, 2026.01.05 දින සිට 2026.01.09 දින තෙක් 6 ශ්‍රේණියේ සිසුන් සහ දෙමාපියන් සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට හා දිශානුගත කිරීමට අදාළ වැඩසටහන් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු අතර, 2026.01.21 වන දින සිට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට

අදාළ ඉගෙනුම් කටයුතු සිදු කිරීම ආරම්භ කළ යුතු ය. මේ සම්බන්ධව අදාළ උපදෙස් ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**4.0** අ.පො.ස. (උසස් පෙළ) – 2025 විභාගයේ දෙවන අදියර 2026.01.12 සඳුදා සිට 2026.01.20 අඟහරුවාදා තෙක් පැවැත්වීමට නියමිත ය.

**5.0** පොදු කරුණු

5.1 තාවකාලිකව සිසුන් පාසල් වෙත යොමු කිරීම

5.1.1 ප්‍රවාහන අපහසුතා පවතින හා ආපදාවට ලක්වූ පාසල්වල සිසුන්ට තම පදිංචියට ආසන්නතම පාසලෙහි තාවකාලික ව අධ්‍යයන කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

5.1.2 පදිංචියට ආසන්න පාසල් වෙත සිසුන් තාවකාලිකව යොමු කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත බලය පවරනු ලබන අතර, එලෙස, පාසල් වෙත යොමු කෙරෙන සිසුන්ගේ තොරතුරු ලේඛනයක් කලාප අධ්‍යාපන කාර්යාලයේ ගොනු ගත කර පවත්වා ගත යුතු ය.

5.1.3 තාවකාලිකව පාසල වෙත යොමු කෙරෙන සිසුන්ගේ පැමිණීම තාවකාලික නාම ලේඛනයක සටහන් කළ යුතු ය.

5.1.4 තාවකාලිකව ඇතුළත් කරනු ලබන සිසුන්ගෙන් කිසිදු ගාස්තුවක් අය නොකළ යුතු ය

5.2 පාසල් ආරම්භ කිරීමෙන් පසු ආපදාවට ලක්වූ සිසුන්ගේ නාම ලේඛනයක් හා ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු ය. එමෙන් ම, එම සිසුන්ගේ මානසික යහපැවැත්ම ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතු ය.

5.3 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් පිළිබඳ අවධානය යොමු කර ඔවුන්ට අධ්‍යාපන උපකරණ හා අවශ්‍ය පහසුකම් සලසා දීමට පියවර ගත යුතු ය.

5.4 ආපදාවට ලක්වූ අ.පො.ස. (උසස් පෙළ) හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා පෙනී සිටීමට නියමිත සිසුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය පාඩම් සටහන් ඇතුළු ඉගෙනීම් උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හා මානසික යහපැවැත්ම ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

5.5 ආපදා තත්ත්වය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා පවතින දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණෙන සිසුන් සඳහා නේවාසිකාගාර පවතින පාසල්වල හැකියාව පවතින පරිදි තාවකාලිකව නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතු ය.

5.6 ආපදා තත්ත්වය හා අනෙකුත් සාධාරණ කරුණු පදනම් කර ගනිමින් පාසල නැවත ආරම්භ කළ මුල් කාලය තුළ සිසුන් සඳහා පාසල් නිල ඇඳුම අනිවාර්ය නොවන අතර, සිසුන්ට හා අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල නිලධාරීන්ට පාසලට සුදුසු ඇඳුමකින් සැරසී පාසලට පැමිණෙන ලෙස දැනුවත් කළ යුතු ය.

CamScanner

5.7 ආපදා තත්ත්වය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා පවතින සිසුන් හා අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල නිලධාරීන් සඳහා පාසලට පැමිණීම හා පිටවීමේ වේලාවන් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් විසින් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කර සුදුසු පරිදි සහන ක්‍රියාමාර්ග ගත යුතු ය.

5.8 ආපදා සහන කටයුතු

5.8.1 ආපදා සහන කටයුතු සඳහා සිසුන්ගෙන් කිසිදු ආකාරයකට මුදල් එකතු කිරීමක් සිදු නොකළ යුතු අතර, ශ්‍රමදායකත්වය ලබා ගන්නේ නම්, වයස අවු.14ට වැඩි සිසුන් පමණක් දෙමාපිය අවසරය හා ගුරුවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සම්බන්ධ කර ගත යුතු ය.

5.8.2 ශ්‍රමදායකත්වය සඳහා සිසුන් දුර බැහැර පාසල් වෙත රැගෙන යන්නේ නම්, මෙම අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 51/2023 හි උපදෙස් ප්‍රකාරව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ අවසර ලබා ගත යුතු ය.

5.9 පාසල් පෝෂණ වැඩසටහන

5.9.1 පාසල් පෝෂණ වැඩසටහන 2025.12.16 දින සිට ආරම්භ කළ යුතු අතර ආපදාවට ලක්ව ඇති ප්‍රදේශවල පෝෂණ වැඩසටහන ආරම්භ කිරීමේ දී මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ සහ උපදෙස්වලට යටත් ව කටයුතු කළ යුතු ය.

5.9.2 පෝෂණ වැඩසටහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 14/2025 හා 2025.04.01 දිනැති චක්‍රලේඛයට අනුව එක් ආහාර සැපයුම්කරුවෙකු මඟින් ආහාර සැපයීම උපරිම වශයෙන් සිසුන් 200ක් සඳහා සීමා කර ඇතත්, ආපදාවට ලක්ව ඇති ප්‍රදේශවල සැපයුම්කරුවන් සම්බන්ධව ගැටලු පවතීනම් 2025 වර්ෂයේ පාසල් පැවැත්වෙන ඉදිරි දින කිහිපය සඳහා පමණක් එම සීමාව නොසලකා කටයුතු කළ යුතු ය.

තව ද, ඇමුණුමෙහි සඳහන් 2025.12.16 දින ආරම්භ නොකරන පාසල් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තීරණය කරනු ලබන දිනයක දී ආරම්භ කළ හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

නාලක කලුවැව
ලේකම්

CamScanner